# උෟවේ ඓතිහාසිකත්වය හෙළි කරන රාක්ෂස හා යක්ෂ ගෝත්‍රිකයෝ (ඓතිහාසික, පුරාවිද්‍යාත්මක සාක්ෂි මෙන් ම සංස්කෘතික සාධක ඌන පුරකව සිදුකරන මානවවංශ පුරාවිද්‍යාත්මක පර්යේෂණයකි)

**හර්ෂණී මිල්ලගහතැන්න**
භාෂා අධ්‍යයන අංශය, සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය,
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ.
*harshimtc2010@yahoo.com*

ප්‍රමුඛ පද : ඌවෙ, ප්‍රාග් ඉතිහාසය, පුරාවිද්‍යාව, ජන සංස්කෘතිය, ඌන පුරක

**හැඳින්වීම**

ඉතිහාසයේ ඇතැම් සංසිද්ධීන් තහවුරු කිරීමට පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර අතිශයින් වැදගත් සාක්ෂි සපයයි. ඓතිහාසික මූලාශ්‍ර තුළ පවත්නා සංසිද්ධීන්ට ඒ මඟින් යම් විශ්වසනීයත්වයක් ලැබීම ඊට හේතුවයි. ඉතිහාසය අතීතයට උරුමව පවතින්නකි. පුරාවිද්‍යාව එකී අතීතය වර්තමානයේ සිදුකරන කැනීම් තුළින් සොයා බලා තහවුරු කිරීමකි. විමසීමකි. මෙවන් පසුබිමක් තුළ ජන සංස්කෘතියේ පවත්නා ඇතැම් ඓතිහාසික සංසිද්ධීන් කෙරෙහි ඉතිහාසය සහ පුරාවිද්‍යා විෂය තුළ ඇත්තේ අඩු පිළිගැනීමකි. ඉතිහාසය ලියා තබන්නාගේ ස්ව රුචිකත්වයට වැඩි ඉඩක් ලැබීමත් ලේඛකයාට රුචි නොවූ ද ඉවත් වීමත් සාමාන්‍ය තත්ත්වයකි. එසේම තත් කාලීන ව පවත්නා දේශපාලන සමාජ ආර්ථික හා සංස්කෘතික ප්‍රවණතාද තත් කාර්යයයේ දී බලපානු ලබයි. පුරාවිද්‍යාව තුළින් පිළිගනු ලබන්නේ තම කැනීමට ලක් වූ වපසරිය පමණකි. එසේ වුවත් ඉතිහාසය හා පුරාවිද්‍යාවට අනාවරිත නොවූ බොහෝ ඓතිහාසික ප්‍රවණතා ජන විඥාන තුළ පැවතීම විශේෂ සන්සිද්ධියකි. පුරාවිද්‍යාව මෙන්ම ඓතිහාසික මූලාශ්‍ර තුළින් සනාථ කරන ලද දෑ ජන සංස්කෘතිය තුළින් ද ඔප්පුවන අවස්ථා පවතින බව පෙන්වීම මාගේ අධ්‍යයනයේ මූලික අරමුණකි. එකී අධ්‍යාශය ගම්‍ය කරනු පිණිස ඌවේ ප්‍රාග් ඓතිහාසික යුගයේ ජීවත් වූ යක්ෂ හා රාක්ෂස ගෝත්‍රිකයින් පිළිබඳ ව හමුව ඇති පුරාවිද්‍යාත්මක ඓතිහාසික හා ජන සංස්කෘතික සාධක ඌන පූරක කරගනිමින් ඌවේ ප්‍රාග් ඓතිහාසික යුගය පිළිබඳ හෙළි කිරීම අනු ප්‍රධාන අරමුණු වේ.

මාගේ පර්යේෂණ ගැටලුව වන්නේ ඉතිහාසය හා පුරාවිද්‍යාවට ඌව පුරක සැපයීමට ජන සංස්කෘතික ප්‍රවණතා

තුළින් යම් ආලෝකයක් ලැබෙන්නේ ද යන්නයි.

**ක්‍රමවේදය**

උක්ත පර්යේෂණාත්මක අධ්‍යයනයේ දී ක්‍රමවේද කිහිපයක් ඔස්සේ දත්ත රැස් කිරීම සිදුවිය.මූලික වශයෙන් ක්ෂේත්‍ර අධ්‍යයනය සහභාගිත්ව නිරීක්ෂණය සිදු කෙරුණි. ඌවේ පවතින කිරි අම්මා හා කිරි අප්පා දාන මෙන්ම වාර්ෂික ව පැවැත්වෙන මහියංගන වැදි පෙරහැර සියැසින් දැක අවශ්‍ය දෑ සටහන් කරගැනීමත් හඬපටවලට ගැනීමත් ඡායාරූප ගත කිරීමත් සිදුවිය. තත් පූජා කර්මයන්ට සහභාගී පිරිස් සමඟ සිදුකළ සම්මුඛ සාකච්ඡා තුළින් දත්ත රැස්කර ගැනීමට හැකිවිය. ද්විතීයික මූලාශ්‍ර භාවිතය පුස්තකාල පරිශීලනය තුළින් සිදුකෙරුණි.

**ප්‍රතිඵල හා සාකච්ඡාව**

ඌවේ ප්‍රාග් ඓතිහාසික සමයේ වාසිත යක්ෂ හා රාක්ෂස ගෝත්‍රිකයින් පිළිබඳව සාධක තහවුරු කිරීමට ඓතිහාසික පුරාවිද්‍යාත්මක සාධක සඳහා උපපූරක සැපයීමට ජන සංස්කෘතික සාධක ඉවහල් කරගත හැකිය යන්න මාගේ පර්යේෂණය තුළින් සනාථ විය.එහි ප්‍රතිඵල මෙසේ පෙළ ගැස්විය හැකි ය.

රාවණා රාජ්‍යය සමයේ දී රජුගේ අගනුවර ලෙස කලක් බඳුලු පුරය පැවතුණු බවත් ඒ අනුව තත් රාජධානියෙහි "මහනුවර" ලෙස සලකන "රාවණා කෝට්ටේ" මුහුදට ගිලුණු පසු "සුළු නුවර" වූ බදුල්ල, ප්‍රධාන මධ්‍යස්ථානය වූ බවත් මෙකල රාවණා රජුගේ රාජකීය උයන ලෙසට ඌව දේශය තෝරා ගත් බවත් ඓතිහාසික මූලාශ්‍රයක් වූ රාජාවලිය තුළ සඳහන්වේ. තත් සිදුවීම කඩයිම් පොතේ මෙසේ සඳහන් වේ "...මුහුදු තෙරපටන් රට මැදින් දකුණු දිග කළුතොට දක්වා පලමු යට කියන ගල්ටැම් හා රාවනා අවධියෙහි ඔහුගේ උයන ඌවය. සුළුනුවරය බදුල්ලය. මහනුවරය මූදට ගිලුනේය..." (අභයවර්ධන 1978:208).

උක්ත සංසිද්ධිය ප්‍රකට කරන රාමරාවණ ජනප්‍රවාද ඇතුළත් ජන සංස්කෘතික සාධක හා සම්බන්ධ දිවුරුම්පොළ, දිවුරුම් බෝධිය, සීතා එළිය, සීතා කොටුව, නුවර එළිය, රාවණාගිරි ගුහාව, ස්ත්‍රී කන්ද, මහා රාවණා කොටුව, රාවණා ඇල්ල හා රාවණ විහාරය වැනි ස්ථාන (ධම්මානන්ද හිමි,1961:53-54) බදුල්ල අවට ප්‍රදේශවල පිහිටා තිබේ.

ආර්ය ලංකාවතරණ සූත්‍රය රාවණාගේ ඉල්ලීම බුදුන් වහන්සේ දේශනා කරන ලද්දකි (ලංකාවතාර සූත්‍රය, 2002). රාමායණ කර්තෘ වාල්මිකී කරන්නට යෙදුණු රත්නගිරි, රත්න පර්වත, ලංකාගිරි, ලංකාපුර යන (ලක්ගල නාමයේ) සංස්කෘත පාලි පරිවර්තිත රූප වලින් ප්‍රකාශිත "රාවණ නගරය" ලග්ගල, මිණිපේ, මහියංගණ ප්‍රදේශාශ්‍රිත වූවක් බව ඓතිහාසික හා සමාජ විද්‍යාත්මක සාධක රාශියකින් මේ වනවිට අනාවරණය වෙති යි මහාචාර්ය විමල විජයසූරිය ප්‍රකාශ කරයි.ඒ අනුව රාවණා රජුගේ පාලන

සමයේ දී ළඟව දේශය "ලංකාපුරය"වශයෙන් හැඳින් වූ බවත් ළඟව මධ්‍යස්ථානය කොට පැවැති සමස්ත දිවයින රාවණා රාජ්‍යය වශයෙන් හැඳින් වූ බවත් නිගමනය කිරීම සහේතුක ය (ඇඳගම 1991:182).

ක්‍රිස්තු පූර්ව 900 දී පමණ ඉතිහාසයකට අයත් පැරණි ශිෂ්ටාචාරයක් ලක්දිව පැවැති බවට මෑතක දී සිදුකළ පුරාවිද්‍යාත්මක පර්යේෂණ තුළින්ද තහවුරු විය(සුදූසිංහ,2015:1). බණ්ඩාරවෙල, දියතලාව හා බදුලු දිස්ත්‍රික්කයේ පිහිටි නිල්ගල ගුහා ආශ්‍රිත ව ශිලා යුගයේ ආයුධ හමුවී ඇත (Noone and Noone, 1940: 3-7; Wijesekara, 1987). රාවණ රජු හා ඔහුගේ දරු මුණුබුරු පරම්පරා කිහිපයක් පිළිබඳ තොරතුරු ඇතුළත් ශිලාලේඛන ලැබී තිබීම උක්ත අදහස තීව්‍ර කිරීමකි (පතිරආරච්චි, 2005).

මාර්ටින් වික්‍රමසිංහගේ හා සෙනරත් පරණවිතානගේ අදහස් හා මතවාද තුළ රාවණ නම් රජෙකු මෙරට වාසය නොකළ බවට කරුණු දක්වා තිබේ. එසේ වුවත් රාවණ රජු සම්බන්ධ පුරාවිද්‍යාත්මක සාක්ෂි මේ වනවිට ලැබෙමින් තිබීම උක්ත අදහස් ඛණ්ඩණය වීමට ප්‍රබල ලෙස බලපා ඇත.

දේශීය මෙන් ම විදේශීය විද්වතුන් අතර මෙතෙක් පිළිගැනී තිබු මතවාදය වූයේ සිංහල ලේඛන කලාවේ ප්‍රභවය සහ විකාසය දේවානම්පියතිස්ස රාජ්‍ය යුගයේ දී (ක්‍රි.පු. 307-267) සිදු වූ බවකි. එසේ වුවත් 1988 වර්ෂයේ ආචාර්ය සිරාන් දැරණියගල සිදුකළ අනුරාධපුර ඇතුළුනුවර කැණීමේදී හමු වූ බ්‍රාහ්මී අක්ෂර සහිත වළං කැබැල්ල ක්‍රි.පු. 6 වන සියවසට අයත් බව තීරණය වීමත් මින් වසර විසිහතකට පසුව ඉන්දියාවේ තමිල්නාඩුවේ කොන්ගු ප්‍රදේශයේ වූ කොඩුමනල් හා පෙරුන්තාල් නැමැති මෙගලිතික සුසාන කැණීමේදී ක්‍රි.පු. 490 අයත් බ්‍රාහ්මී අක්ෂර සහිත වළං කටු කැබලි සොයාගනු ලැබීමත් හමුවේ වර්තමානය වනවිට දකුණු ආසියාව ප්‍රමුඛ ලෝකය පිළිගනු ලබන්නේ ධර්මාශෝක අධිරාජ්‍යයාට පෙර සිටම බුදුන් ජීවමාන සමයේදීත් ලංකාව සහ ඉන්දියාව බ්‍රාහ්මී අක්ෂර කලාව භාවිත කළ බවයි.එනම් විජයාවතරණ යුගයේත් ඊට පෙර යුගයන්හිදීත් බ්‍රාහ්මී අක්ෂර කලාව මෙරට භාවිත වූ බව මෙයින් සූචනය වේ (සඳරුසි, 2015:01).

දඹදිව ආර්යාවර්ථයේ සිටි රාක්ෂ ගෝත්‍රිකයින් සංස්කෘත භාෂාවේ පරතෙරට පැමිණ සිටිබව පිළිගනු ලබන බැවින් එහිසිට ලක්දිවට සංක්‍රමණය වූ රාවණගේ පරපුරට අයත් රාක්ෂ ගෝත්‍රිකයින්ගේද මුල් භාෂාව සංස්කෘත වූ බවට සැක නැත. ඔවුහු සංස්කෘත භාෂාවේ ප්‍රශස්තයින් බව රාවණ යුගයේ සිට පැවත එන උඩ්ඩිශ තන්ත්‍ර, කුමාර තන්ත්‍ර, අර්කප්‍රකාශ හා නාඩි පරීක්ෂා ආදී ශාස්ත්‍රීය කෘති පරීක්ෂා කළ භාෂා ශාස්ත්‍රඥයින් විශ්වාස කරති (ඥාණාලෝක හිමි, 1933). පෙරදිග භාෂා ශාස්ත්‍රඥ මෝනියර් විලියම්

පවසන්නේ රාවණා චතුර්වේදය පරාගත බැව් රාමායණයේ කියා තිබෙන බවයි. රාවණගේ සහෝදර වූ විභීෂණ සහ අතිකාය යන මොවුහු ධර්මිෂ්ඨයෝ යැයි ද එම ග්‍රන්ථයේ ම සඳහන් වෙති'යි විලියම් මහතා වැඩි දුරටත් සඳහන් කර ඇත (Williams, 1875:383).

එබැවින් ඔවුහු අක්ෂර කලාවත් ලේඛන ක්‍රමයත් දැන සිටිබව අනුමාන කිරීම සහේතුක වෙති. උක්ත තත්ත්වය හමුවේ ජයරත්න පතිරආරච්චි ඉදිරිපත් කරන රාවණා රජු සහ ඔහුගේ දරු මුණුබුරු පරම්පරාව සම්බන්ධ තොරතුරු ඇතුළත් සෙල්ලිපි මෙන් ම ක්‍රි.පු. 6 වන සියවසට ආසන්නයේ මෙරට රජ්‍යය විචාළේ යැයි විශ්වාස කරන පණ්ඩිත මහරජුගේ සහ ඔහුගේ භාණ්ඩාගාරික වූ සුමනගේ (පසුව සමන් දෙවි බවට පත් වූ) සෙල්ලිපිත් (පතිරආරච්චි, 2005:53-99) පිළිබඳ නැවත විමර්ශනය කිරීම සුදුසුය. මේවා උක්ත රාවණ හා පණ්ඩිත රජවරුන්ට සම කාලීනව රචනා කරන්නට වූවා යැයි සිතීම සහේතුකය.

මෙමඟින් අවධාරණය වන විශේෂ කරුණක් වන්නේ රාවණා රජු පිළිබඳ මෙතෙක් අනාවරණය නොවුණු පුරාවිද්‍යාත්මක සාක්ෂි මෙමඟින් පූරණය වන හෙයිනි. එබැවින් රාවණ රජු හා ඔහුගේ රාජධානිය මෙ ලක්දිව නොවූයේ යැයි පැවසීම හා එය හුදු ප්‍රලාපයක් සේ ගැනීම තවදුරටත් සිතා බැලිය යුත්තකි.

ඉහළ ඌවේ මහියංගණය බල කේන්ද්‍රය කරගනිමින් ක්‍රි.පු. හයවන සියවසේ දී යක්ෂ ගෝත්‍රිකයන්ගේ රාජධානිය පැතිර පැවැතුණු බව බුදුන්ගේ ප්‍රථම ලංකා ගමනේ දී අනාවරණය වේ (මහාවංශය, 1959:1 පරි;20-22). තත් වෙසෙස ජන සංස්කෘතිය මඟින් පූරණය වන්නේ වාර්ෂිකව සිදු කෙරෙන මහියංගණ වැදි පෙරහැර තුළිනි. බුදුන් වහන්සේට එදා යක් ගෝත්‍රිකයින් විරුද්ධත්වය ප්‍රකාශ කළ බවත් මූලාශ්‍ර තුළ අන්තර්ගත ය. තත් සිදුවීමේ මීතයක් ලෙසට අදටත් මෙකී සන්සිද්ධිය වැදි ජනයා වැදි පෙරහැර තුළින් නිරූපණය කිරීම විශේෂත්වයකි.

ඌවේ කිරි සහ අම්මා කිරි අප්පා පූජාකර්මයත් සිංහල අලුත් අවුරුදු නැකැත් අවස්ථාවේ හත් මාළුව සමඟ පුදන යක් ගොටුවත් කතරගම දෙවි විවාහ කරගත් වල්ලි අම්මා පුවතත් කතා ව්‍යවහාරයේ භාවිත යකා, යකෝ ආදී වදන් පිළිබඳවත් ජන සංස්කෘතික තොරතුරු ලැබීමෙන් උක්ත සංසිද්ධීන්ට ආලෝකයක් ලැබේ. බදුල්ල මොණරාගල අවට අදටත් ජීවත්වන වැදි ජනයාගේ සංස්කෘතිය තත් වෙසෙස තවදුරටත් අවධාරණය කිරීමට සමත් ය.

## ආශ්‍රිත ග්‍රන්ථ

ලංකාවතාර සූත්‍රය, 2002. (පරි) ගුණපාල ධර්මසිරි දෙහිවල: වයි එන් ප්‍රින්ටර්ස්.

පතිරආරච්චි, ජයරත්න 2005. දකුණු සිරිපතුල පිහිටි මක්කම සහ රාවණා රජුගේ සෙල්ලිපි

බොරලැස්ගමුව: උදිත ග්‍රැපික්ස් පුද්ගලික සමාගම.

Noone N.A., Noone H.V.V., 1940. "The Stone Implements of Bandarawela Ceylon" Ceylon Journals of Science Vol III Part I.